**කොළඹ විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව**

**ශාස්ත්‍ර පීඨය**

**ශාස්ත්‍රවේදී තුන්වන වසර පරීක්ෂණය - දෙවන සෙමෙස්තරය - 2017/2018**

**PSC 3262 - ප්‍රාදේශීය ආණ්ඩුකරණයේ මෑත කාලීන ප්‍රවණතා**

**කාලය : පැ දෙකයි (02)**

ප්‍රශ්න **තුනකට (03)** පමණක් පිළිතුරු සපයන්න.

එක් පිළිතුරකට ලැබෙන උපරිම ලකුණු ප්‍රමාණය **විස්සකි (20).**

---

01. "ප්‍රාදේශීය මට්ටමේ දී ආණ්ඩුකරණය යනු ආණ්ඩුක්‍රම යාන්ත්‍රණයක් වශයෙන් පමණක් දකිනවාට වඩා විශාල වශයෙන් ප්‍රාදේශීය අධිකාරයන් සමග ප්‍රජාව දක්වන අන්තර්ක්‍රියාව පිළිබඳ පුළුල් දැක්මක් ඇතුළත් වන දෙයකි." (USAID අත්පොත, 2000). මේ ප්‍රකාශය විභාග කරන්න.

02. පහත සඳහන් තේමා කෙටියෙන් විභාග කරන්න.

    i. ප්‍රාදේශීය ස්වයං පාලනය සහ බිම් මට්ටමේ ප්‍රජාතන්ත්‍රවාදය
    ii. යහ ආණ්ඩුකරණය සඳහා විමධ්‍යගතකරණය
    iii. ප්‍රාදේශීය ආණ්ඩුකරණ ප්‍රතිසංස්කරණය
    iv. ජනතා සහභාගීත්ව අයවැය

03. ටොක්විල්ගේ සාංගමික ප්‍රජාතන්ත්‍රවාදී න්‍යාය පැහැදිලි කොට ප්‍රාදේශීය ප්‍රජාතන්ත්‍රවාදයට එහි ඇති අදාළත්වය පරීක්ෂා කරන්න.

04. i. 'සමාජ ප්‍රාග්ධනය' යන්න නිර්වචනය කරන්න.

    ii. රොබට් පට්නම් 'සමාජ ප්‍රාග්ධනය' යන්න න්‍යායිකකරණය කරන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

05. පහත සඳහන් ප්‍රකාශවලින් එකක් සාකච්ඡා කරන්න.

    **එක්කෝ**

    "ඉන්දියාවේ ප්‍රජාතාන්ත්‍රික ප්‍රාදේශීය ආණ්ඩුකරණය යටතේ පංචායත් රාජ් ක්‍රමය ප්‍රධාන භූමිකාවක් ඉටු කරයි."

    **නැතහොත්**

    "ප්‍රාදේශීය ප්‍රජාතන්ත්‍රවාදය සහ විමධ්‍යගතකරණ සැළසුම්කරණය වර්ධනය කිරීම සඳහා කේරළයෙහි ජනතා සැළසුම්කරණ අත්දැකීම (PPE) පුළුල් පිළිගැනීමකට ලක් ව ඇත."

06. පහත සඳහන් මාතෘකාවලින් **දෙකක් (02)** පිළිබඳ සටහන් ලියන්න.

    i. දේශපාලන සංවිධාන සහ සිවිල් සංවිධාන
    ii. ප්‍රාදේශීය ස්වායත්තතාව සහ ප්‍රාදේශීය සුළුතරය
    iii. බහුත්වවාදය සහ ප්‍රාදේශීය ප්‍රජාතන්ත්‍රවාදය
    iv. පළාත් ආණ්ඩුකරණ ආයතනවල ස්ත්‍රීන්ගේ කෝටාව

*************************